# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2022 පෙබරවාරි මස 18 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකි ය.

**මිල :** රු. 14.00 **තැපැල් ගාස්තුව :** රු. 15.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

එල්.ඩී.—ඕ. 2/2018

## 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2022 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 1979 අංක 15 දරන පනතේ 195 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:-

"(ඇ) 195අ වන වගන්තිය යටතේ පැවැත්විය යුතු පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණය පවත්වනු ලබන දිනය චූදිතයාට සහ අතෘප්තියට පත් පාර්ශ්වයට දැන්විය යුතු ය;";

(2) එහි (ඉ) ඡේදය ඉවත් කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලබන අතර, ඒ වගන්තිය ඒ ප්‍රඥප්තියේ 195අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය- ප්‍රධාන ප්‍රඥප්තියට 195අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"අ-1- පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණ

පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණ මහාධිකරණයෙහි පැවැත්විය යුතු බව

195අ. (1) පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක් -

(අ) 195 වන වගන්තිය ප්‍රකාරව අධිචෝදනා පත්‍රය චූදිතයා වෙත භාරදුන් විට, චූදිතයා ඉදිරිපිට දී; හෝ

(ආ) 241 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් හේතුවක් මත චූදිතයා පැමිණ නොසිටින අවස්ථාවක හෝ 241 වන වගන්තියේ

(1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති හේතු මත අධිචෝදනා පත්‍රය චූදිතයා වෙත භාරදීමට නොහැකි අවස්ථාවක, චූදිතයා නොමැතිව,

පවත්වනු ලැබිය යුතු ය.

(2) පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක් -

(අ) අවස්ථාවෝචිත පරිදි, (මෙහි මින්මතු "චෝදනාව මෙහෙයවන නීතිඥවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නීතිපතිවරයා විසින් පවරන ලද නඩු කටයුතුවලට අදාළව නීතිපතිවරයාගේ හෝ 193 වන වගන්තියේ සඳහන් නිලධරයකුගේ හෝ අල්ලස් සහ දූෂණ වැළැක්වීමේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පවරන ලද නඩු කටයුතුවලට අදාළව එම අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ හෝ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් බලය දෙනු ලැබූ එම කොමිෂන් සභාවේ යම් නිලධරයකුගේ හෝ එම කොමිෂන් සභාව විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ යම් නීතිඥවරයකුගේ ;

(ආ) චූදිතයා වෙනුවෙන් පෙනී සිටින යම් නීතිඥවරයකු සිටී නම්, එම නීතිඥවරයාගේ;

(ඇ) අතෘප්තියට පත් පාර්ශ්වය විසින් හෝ එකී අතෘප්තියට පත් පාර්ශ්වය වෙනුවෙන් පෙනී සිටින යම් නීතිඥවරයකු සිටී නම් එකී නීතිඥවරයා විසින් පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණයට සහභාගීවීම සඳහා ඉල්ලීමක් කර ඇත්නම්, එකී අතෘප්තියට පත් පාර්ශ්වයේ හෝ නීතිඥවරයාගේ;

(ඈ) වරද සම්බන්ධයෙන් විමර්ශනය පවත්වනු ලැබූ පොලිස් ස්ථානය තත්කාලයේ භාරව සිටින නිලධරයාගේ හෝ ඔහු නියෝජනය කරන නිලධරයකුගේ**;** සහ

(ඉ) නීතිඥවරයකුගේ හෝ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින්, එම නඩුවේ

පාර්ශ්වකරුවන්ගේ කැමැත්ත ඇතිව, එකී පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයට සහභාගීවීම සඳහා අවසර දෙන ලද වෙනත් යම් නිලධරයකුගේ,

සහභාගීත්වය ඇතිව, පවත්වනු ලැබිය යුතු ය.

(3) පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක්-

(අ) චූදිතයාට නීත්‍යානුකූලව ලබා ගැනීමට හිමිකම ඇති සියලු දේ චෝදක පක්ෂය විසින් චූදිතයා වෙත භාර දී ඇත් ද යන්න නිශ්චය කර ගැනීමේ සහ අධිකරණය විසින් ඒ සම්බන්ධයෙන් උචිත ආඥා කිරීමේ කාර්යය සඳහා;

(ආ) අධිචෝදනා පත්‍රයේ සඳහන් චෝදනාවලින් එකකට හෝ ඊට වැඩි චෝදනා සංඛ්‍යාවකට හෝ ඊට අඩු වරදකට චූදිතයා විසින් තමා වරදකරු බවට උත්තරවාද දීමට අදහස් කරන්නේ ද යන්න නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා;

(ඇ) 126අ වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි ස්වකීය ලිහිල් කිරීමේ හෝ දෝෂ මුක්තිකාරක විත්තිවාචක පිළිබඳ සහ නොතැනියාව පිළිබඳ පූර්ව දැනුම් දීමක් සිදුකිරීමට චූදිතයාට අවස්ථාවක් ලබාදීමේ කාර්යය සඳහා;

(ඈ) අධිචෝදනා පත්‍රය ජූරි සභාවක් මගින් නඩු විභාග කරනු ලැබිය හැකි වරදකට අදාළ වන්නේ නම්, ජූරි සභාවක් මගින් නඩු විභාග කරනු ලැබීමට තෝරා ගනු ලබන්නේ ද නැද්ද යන්න චූදිතයාගෙන් විමසීමේ හෝ 208 වන වගන්තිය යටතේ විශේෂ ජූරි සභාවක් අවශ්‍ය වන්නේ ද යන්න චෝදනාව මෙහෙයවන නීතිඥවරයාගෙන් හෝ චූදිතයාගෙන් විමසීමේ කාර්යය සඳහා;

(ඉ) විශේෂඥ සාක්ෂිකරුවන්ගේ වාර්තා අධිකරණය විසින් භාරගෙන චූදිතයා වෙත භාර දී තිබේ ද යන්න නිශ්චය කර ගැනීමේ සහ එසේ සිදුකර නොමැති නම්, ඒ සම්බන්ධයෙන් උචිත ආඥා කිරීමේ කාර්යය සඳහා;

(ඊ) විශේෂඥ සාක්ෂිකරුවන්ගේ වාර්තාවලට අදාළ වන සහ එම වාර්තාවල අන්තර්ගතයට අදාළ වන පිළිගැනීම් ද ඇතුළුව, චූදිතයා විසින් කරන ලද පිළිගැනීම් කිසිවක් තිබේ නම්, 420 වන වගන්තියේ විධිවිධාන කෙරෙහි සැලකිල්ලක් දක්වමින්, ඒ පිළිගැනීම් වාර්තාගත කිරීම සඳහා:

එසේ වුවද, චූදිතයා, නීතිඥවරයකු මගින් ස්වකීය නියෝජනය සිදු නොකරන්නේ නම්, චෝදක පක්ෂය විසින් යෝජනා කරනු ලබන පිළිගැනීම් කිසිවක් වාර්තාගත කිරීම නොකළ යුතු ය;

(උ) ඇතැම් සාක්ෂි ආවේශ්‍ය කරගැනීම සඳහා වන පූර්ව කොන්දේසි සපුරා තිබේද යන්න නිශ්චය කරගැනීමේ සහ ඒ සම්බන්ධයෙන් ආඥා කිරීමේ කාර්යය සඳහා;

(ඌ) 263 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නඩු විභාගයක් පැවැත්වීම පිණිස සාක්ෂිකරුවන් විභාග කිරීම ඇතුළුව තම අදාළ නඩුවල කරුණු ඉදිරිපත් කිරීම සඳහා අදාළ පාර්ශ්වයන්ට ආසන්න වශයෙන් අවශ්‍ය විය හැකි කාලසීමාව පිළිබඳ චෝදනාව මෙහෙයවන නීතිඥවරයා සහ විත්තියේ නීතිඥවරයාගෙන් නිශ්චය කර දැන ගැනීමේ කාර්යය සඳහා;

(එ) චෝදක පක්ෂයේ සහ විත්ති පක්ෂයේ නඩුවල කරුණු ඉදිරිපත් කිරීම සඳහා, සාමාන්‍යයෙන් අධිකරණයෙහි නොතිබිය

හැකි අමතර පහසුකම් අවශ්‍ය විය හැකි ද යන්න නිශ්චය කරගැනීමේ සහ ඒ සම්බන්ධයෙන් උචිත ආඥා කිරීමේ කාර්යය සඳහා;

(ඒ) නඩු විභාගයේ දී චෝදක පක්ෂයට සහ විත්ති පක්ෂයට අවශ්‍ය විය හැකි නඩු භාණ්ඩ, ප්‍රදර්ශක, වෙනත් යම් තථ්‍ය සාක්ෂි, වාර්තා, පොත්පත්, නඩු වාර්තා හෝ වෙනත් යම් දේ තිබේ ද යන්න නිශ්චය කරගැනීමේ සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ආඥා කිරීමේ කාර්යය සඳහා;

(ඔ) එක් සාක්ෂිකරුවකුගේ හෝ ඊට වැඩි සාක්ෂිකරුවන් සංඛ්‍යාවකගේ සාක්ෂි සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සම්බන්ධකයක් මගින් මෙහෙය විය යුතු ද යන්න නිශ්චය කරගැනීමේ සහ එසේ කළ යුතු නම්, ඒ සම්බන්ධයෙන් උචිත ආඥා කිරීමේ සහ වැඩපිළිවෙල යෙදීමේ කාර්යය සඳහා;

(ඕ) 263 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි නඩු විභාගයක් ආරම්භ කිරීම සඳහා හැකිතාක් ඉක්මණින් දිනයක් නියම කිරීමේ කාර්යය සඳහා;

(ක) නඩු විභාගය ආරම්භ කිරීමට පෙරාතුව අවධානය යොමු කිරීමට අවශ්‍ය විය හැකි වන්නාවූ ද, නඩු විභාගය පැවැත්වීම සඳහා පහසුකම් සලසන්නාවූ ද, වෙනත් යම් කරුණක් සම්බන්ධයෙන් සලකා බලා ඒ සම්බන්ධයෙන් ආඥා කිරීමේ කාර්යය සඳහා; සහ

(ග) නීත්‍යානුකූල, සාධාරණ සහ ඉක්මන් නඩු විභාගයක් පැවැත්වෙන බවට වග බලා ගැනීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් තීරණ හෝ පියවර ගැනීමේ කාර්යය සඳහා,

පවත්වනු ලැබිය යුතු ය.

(4) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5ඇ වගන්තියේ නිශ්චිතව දක්වා ඇති පරිදි මහාධිකරණ විනිශ්චයකාරවරයා හෝ වාර්තාධිකාරී විනිශ්චයකාරවරයා විසින් පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක මූලාසනය දරනු ලැබිය යුතු ය.

(5) පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක් හැකිතාක් ඉක්මණින් අවසන් කිරීමට සෑම ප්‍රයත්නයක් ම දරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, චූදිතයා අධිකරණය ඉදිරියෙහි පෙනී සිටි දින හෝ අධිකරණය ඉදිරියෙහි පෙනී සිටීමට නියම කරන ලද දින සිට මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් තුළ පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක් අවසන් කරනු ලැබිය යුතු ය.

(6) විශේෂ නඩු විභාගයකට අදාළ පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයක් අදාළ නඩුව විභාග කිරීම සඳහා පත් කරන ලද විනිශ්චයකාරවයන් තිදෙනා ඉදිරිපිට දී පමණක් පවත්වනු ලැබිය යුතු ය.

(7) පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණයක් අවසන් කිරීමේ දී, මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින්-

(අ) එකී පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයේ දී ගන්නා ලද තීරණ කියවා පැහැදිලි කර එකී තීරණවල අන්තර්ගතය එකී පාර්ශ්වයන්ට වැටහෙන බව වාර්තාගත කර එකී තීරණවලට තම අත්සන තබනු ලැබිය යුතු ය; සහ

(ආ) සාක්ෂිකරුවන් සිටින්නේ ද යන්න පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ සඳහන් නිලධරයාට නියම කරනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ කාර්යය සඳහා-

"අතෘප්තියට පත් පාර්ශ්වය" යන්නෙන්, වරදක් සිදු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස යම් කායික, මානසික හෝ චිත්තාවේගී හෝ ආර්ථිකමය හෝ අන්‍යාකාරයකින් වූ යම් අලාභයක් වන්නා වූ යම් හිංසාවක්, හානියක්, දුබලතාවක් හෝ ආබාධයක් අත්විඳින තැනැත්තකු අදහස් වන අතර අතෘප්තියට පත් පාර්ශ්වය ළමයෙක් නම්, එම ළමයාගේ දෙමව්පියන් හෝ භාරකරු ද අදහස් වන අතර එම අතෘප්තියට පත් පාර්ශ්වය මියගොස් ඇත්නම්, ඔහුගේ ළඟම නෑයා, එනම්, ඔහුගේ ජීවත්ව සිටින කලත්‍රයා, දරුවන්, දෙමව්පියන්, සහෝදරයන්, සහෝදරියන් හෝ අනෙකුත් පැවැතෙන්නන් ඊට ඇතුළත් වේ;

"ළමයා" යන්නෙන් වයස අවුරුදු දහ අටට අඩු තැනැත්තකු අදහස් වේ.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 208 වන වගන්තිය සංශෝධනය කිරීම

"(1) (අ) නඩුව විභාග කිරීම සඳහා විශේෂ ජූරි සභාවක් කැඳවන ලෙස නියම කරන ආඥාවක් ලබා ගැනීම සඳහා, චෝදනාව මෙහෙයවන නීතිඥවරයා හෝ චූදිතයා විසින් පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයේ දී මහාධිකරණය වෙත ඉල්ලීමක් කළ හැකි අතර, පූර්ව නඩුවිභාග සම්මන්ත්‍රණයේ මූලාසනාරූඪ විනිශ්චයකාරවරයා විසින් එම ඉල්ලීම වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(ආ) නඩු විභාගය ආරම්භයේ දී, නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා විසින් එකී ඉල්ලීම සාධාරණ හා යුක්ති සහගත යයි සලකනු ලබන අවස්ථාවක එම විනිශ්චයකාරවරයා විසින් ඒ අනුව ආඥාවක් කළ යුතු ය.".

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.